# ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සහ ඇඟලුම් කර්මාන්තය

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
02 APR 2013
UNIVERSITY OF KELANIYA

පී.ඒ.එස්. පොන්නම්පෙරුම
(ශාස්ත්‍රවේදී)
ECON/99/150/R



| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1806 |
| වර්ග අංකය: | |



කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ ආර්ථික විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

2013 මාර්තු

## නිබන්ධන සංක්ෂේපය

ඇඟලුම් අපනයනය ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන සංයුතිය තුළ ඉහළ ප්‍රතිශතයක් හිමි කරගෙන ඇති අතර ප්‍රධාන විදේශ විනිමය ඉපැයීම් මූලාශ්‍රය බවට පත් වී ඇති බැවින් එයට ලංකා ආර්ථිකයේ අද්විතීය ස්ථානයක් හිමි වී ඇත. 1977 දී විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමත් සමග ම, රටේ ආර්ථික සංවර්ධනයට දායක කරගැනීමේ අරමුණෙන් එයට විවිධ දිරිගැන්වීම් හා සානුබලයන් ලබා දෙන ලදී. එම පරමාර්ථය මුදුන්පත් කරගත හැකි වූවා ද යන්න පිළිබඳව ද අධ්‍යයනය කළ යුතු විය.

යථෝක්ත අරමුණෙන් ඇඟලුම් කර්මාන්තය ශ්‍රී ලංකාවේ සේවා නියුක්තිය ඉහළ නැංවීමට, දරිද්‍රතාව පහත හෙළීමට, රටේ ජාතික ආදායම ඉහළ නැංවීමට සහ කාර්මික අපනයන ඉහළ නැංවීමට සිදු කර ඇති දායකත්වය පිළිබඳව ද අධ්‍යයනය කරන ලදී. ඒවාට අමතර ව, මෙම කර්මාන්තය සඳහා පවතින බාධාවන්, එය මුහුණ දෙන අභියෝග හා පවතින දුර්වලතා හඳුනාගැනීම සහ කර්මාන්තයේ උන්නතිය සඳහා ගත යුතු පියවර යෝජනා කිරීමට ද උත්සාහා ගන්නා ලදී. ඒවා සාක්ෂාත් කරගැනීම සඳහා පර්යේෂක විසින් ප්‍රාථමික සහ ද්විතියික මූලාශ්‍ර යොදා ගෙන දත්ත ද එක්රැස් කරගන්නා ලදී.

1977 ට පෙර කෘෂිකාර්මික ආර්ථිකයකට හිමිකම් කී ශ්‍රී ලංකාව කාර්මික ආර්ථිකයක් බවට පත් කරන ලද්දේ ඇඟලුම් කර්මාන්තය විසිනි. මෙම කර්මාන්තය මෙහි සේවා වියුක්තිය අඩු කිරීමටත්, දරිද්‍රතාව අඩු කිරීමටත්, ජාතික ආදායම ඉහළ නැංවීමට සහ කාර්මික අපනයන ඉහළ නැංවීමටත් සෘජුව ම බලපා ඇති බව අනාවරණය කරගත හැකි විය. එයට අමතර ව චක්‍රාකාරයෙන් ද රටේ ආර්ථික සංවර්ධනයට මෙම කර්මාන්තය ඉවහල් වී ඇති බව පෙනිණි. මේ අනුව සමස්තයක් ලෙස ගත්කල රටේ ආර්ථික සංවර්ධනය කෙරෙහි ඇඟලුම් කර්මාන්තය විශාල දායකත්වයක් ලබා දී ඇති බවට නිගමනය කළ හැකි වූයේය.

ඇඟලුම් සේවිකාවන් විවිධ ගැටලු රාශියකට මුහුණදෙන බව අනාවරණය විය. මෙම තත්ත්වය ඔවුන් තුළ අසහනකාරී ස්වභාවයක් ජනිත වීමට හේතු වී ඇති අතර එය සෘජුව ම කර්මාන්තයේ පැවැත්මට බලපා ඇති බව පෙනේ. එමෙන් ම වර්තමානයේ ඇඟලුම් කර්මාන්තය අඛණ්ඩව පවත්වාගෙන යාමට එරෙහි විවිධ බාධක පැනනැගී ඇති අතර මුහුණපෑමට සිදුවී ඇති ගැටළු සහ දුෂ්කරතා ද එමටය.

ඉහත තත්ත්වයන් හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීම කාලීන අවශ්‍යතාවක් වේ. ඒ සඳහා යෝජනා ඉදිරිපත් කළෙමි. පර්යේෂණ සඳහා අවධානය යොමු විය යුතු මෙම කර්මාන්තය හා සම්බන්ධ වැදගත් ක්ෂෙත්‍ර ගණනාවක් ඇති බවද පසක් විය.